**අම්බලන්තොට ප්‍රාදේශීය සභාව,**
**හම්බන්තොට දිස්ත්‍රික්කය.**

---------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 07 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වටිනාකම රු. 841,200 ක් වූ ගොඩනැගිලි 08 ක් පෙර වර්ෂයන් වලදී ඉවත් කර හෝ කඩා වැටී තිබුණද ඒවා ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (ii) | සභාවට අයත් ලුණම අදාහනාගාරයේ ඉදිකරන ලද රු. 2,200,000 ක් වූ LP වායු ඒකකය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියලුම ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ශේෂය රු.2,458,674 ක් හා සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු. 1,000,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාළ එකතුව රු. 5,729,328 ක් වූ ශේෂ, ඊට අදාළ උපයෝගී ලේඛන/ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 709,768 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | අසමානතාව නිවැරදි කිරීමට කටයුතු කරමි |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 163,142,897 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සභාවට පවරා ගැනීමටත්, කාල විශ්ලේශනයක් ඉදිරිපත් කිරීමටත් 2019 වර්ෂයේ අවසාන ගිණුම සඳහා උපලේඛන ලබාදීමටත් කටයුතු කරමි |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | රීති 185 | සභාවේ පොදු ගිණුමේ හා සංවර්ධන ගිණුමේ පැවති අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් ශේෂය පිළිවෙලින් රු. 5,226,443 ක් හා රු. 7,011,233 ක් වුවත් ඉන් කොටසක් හෝ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බාහිර ආයතන වලින් සංවර්ධන කටයුතු සඳහා දෙන මුදල් මෙම ගිණුමට බැර කිරීම හා පසුගිය වර්ෂවලට අදාළ උසාවි දඩ හා මුද්දර ගාස්තු ලැබීම මීට බලපෑ අතර 2019 අප්‍රේල් 30 දිනට සංවර්ධන ගිණුමේ ශේෂය රු. 1,859,000 කි |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌනතා වලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 අවසාන ගිණුම සමඟ ඉදිරිපත් කරමි |
| (ආ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන චක්‍ර ලේඛයේ 05 ඡේදය | කඩ කාමර 101 ක් සඳහා වන ගිවිසුම් වසර 3 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 27 ක ගිවිසුම් යාවත්කාලීන කර ඇති අතර ඉතිරි කඩ කාමර 74 යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,329,171 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 13,693,491 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,910,100 | 4,632,546 | 3,409,957 | 4,008,274 | 5,271,600 | 4,882,392 | 6,072,916 | 4,022,321 |
| කුලී | 16,723,700 | 15,764,400 | 15,207,683 | 3,455,208 | 17,075,700 | 15,775,010 | 17,825,633 | 3,179,316 |
| බලපත්‍ර ගාස්තු | 2,531,300 | 2,608,934 | 2,476,934 | 233,280 | 1,592,000 | 1,669,597 | 1,381,067 | 529,680 |
| වෙනත් ආදායම් | 86,315,300 | 82,248,941 | 67,152,044 | 26,806,049 | 127,046,500 | 105,484,322 | 57,025,583 | 55,780,549 |
| | 110,480,400 | 105,254,821 | 88,246,618= | 34,502,811 | 150,985,800 | 127,811,321 | 82,305,199 | 63,511,866 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල රැස්කළ යුතු සමස්ථ ආදායම රු.168,766,687 ක් වුවද, වර්ෂය තුල රැස්කරන ලද ආදායම රු. 88,246,618 ක් වීමෙන් ආදයම් රැස් කිරීමේ ප්‍රගතිය සියයට 52 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ මුදල රු.34,502,811 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකරගත යුතුවේ. | හිඟ මුදලින් අයවීම් සියයට 52 ක් වීමට හේතු වූයේ පළාත් සභාවෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු නියමිත පරිදි නොලැබීම හා හිඟ යන්ත්‍ර කුලී අය කර ගැනීමට නොහැකි වීමෙනි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු .3,886,424 ක් වූ වරිපනම් බදු ශේෂය තුළ රු. 5,000 ට වැඩි වරිපනම් ඒකක 68 කින් ලැබිය යුතු රු. 1,212,869 ක් වූයෙන් වරිපනම් රැස්කිරීමේ කාර්යසාධනය පහළ මට්ටමක පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් 2019 මාර්තු 31 දිනට රු. 758,413 ක් අයකර ඇති අතර, ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

### 2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 50 කින් ලැබිය යුතු කුලී රු .175,140 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් 2019 මැයි 15 දිනට රු. 90,610 ක් අයකර ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු යන්ත්‍රෝපකරණ කුලී ආදායම් රු. 1,842,904 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද එම ශේෂය තුළ වර්ෂ 2ත් 5ත් අතර හිඟ හිටි ශේෂය රු. 1,470,549 ක් විය. | හිඟ යන්ත්‍රෝපකරණ කුලී කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදලින් රු. 197,435 ක් අයකර ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ආදායම රු. 17,850 ක් වූ අතර එම ශේෂයෙහි හිඟ හිටි කාල පරාසය 2009 වර්ෂයත් 2014 වර්ෂයත් අතර විය. | හිඟ බලපත්‍ර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | 2009 - 2014 වර්ෂ අතර හිඟයක් බවත්, තහවුරු කර ගැනීමේදී ව්‍යාපාර වසා ඇති බැවින් මෙම හිඟ මුදල කපා හැරීම සඳහා කටයුතු සිදු කරමි |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ඒකක 49 කින් අයවිය යුතු වෙළඳ හා කර්මාන්ත බදු රු. 121,850 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ වෙළඳ බදු කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ මුදිලන් රු. 51,600 ක් අයකර ඇති අතර ඉතිරිය කපා හැරීම සඳහා කටයුතු කරමි |

**2.2.6 වෙනත් ආදායම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දැන්වීම් පුවරු 08 කින් ලැබිය යුතු රු. 215,430 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | හිඟ දැන්වීම් පුවරු ගාස්තුවලින් රු. 132,000 ක් අයකර ඇති අතර ඉතිරිය කපා හැරීම සඳහා කටයුතු කරමි |

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.10,190,173 ක් හා රු. 10,092,835 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019 මාර්තු 14 දින රු. 10,000,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරිය අයකර ගැනීමට කටයුතු කරමි |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 07 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරමි |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධනය සඳහා වන දිගු කාලීන සැලසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට වරක් වරිපනම් දේපල තක්සේරු කළ යුතු වුවත් සභාව විසින් 2011 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂයේදීත් වරිපනම් බදු අයකර තිබුණි. | වරිපනම් දේපල කඩිනමින් තක්සේරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වරිපනම් දේපල සඳහා වරිපනම් බදු ප්‍රතිශෝධනයක් කර දෙන ලෙසට 2018 මැයි 21, 2018 අගෝස්තු 20, 2019 පෙබරවාරි 25 දිනැති ලිපි මගින් දිස්ත්‍රික් තක්සේරු කාර්යාලයට දන්වා ඇත. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් සභා බල ප්‍රදේශයේ පිහිටි සන්නිවේදන කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමීක්ෂණයක් කළ යුතුවේ. | ඉදිරියේදී සම්ප්‍රේෂණ කුළුණු සමීක්ෂණයක් සිදු කරමි |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 15 ක් සම්පූර්ණ කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 අප්‍රේල් 10 දින පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ඇත. ඉතිරි පුරප්පාඩු සම්බන්ධව කොමසාරිස් දැනුවත් කර ඇති අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති තනතුරු 03 සඳහා බඳවා ගැනීම් ඉදිරියේදී සිදු කරමි |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාහන 09 ක, සභාව සතු ඉඩම් 12 ක සහ ගොඩනැගිලි 05 ක නීත්‍යානුකූල අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | වත්කම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉඩම් හා ගොඩනැගිලි පවරා ගැනීමට අදාළ බලධාරීන් වෙත ඉල්ලීම් කර ඇති අතර, වාහන 09 ක අයිතිය ඉදිරියේදී පවරා ගැනීමට කටයුතු කරමි |

#### 3.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාවේ 2017 භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ භාණ්ඩ 07 ක ඌනතාවයන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඌනතා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ජල ටැංකි 1 ක් තවාළුවිල පොදු වැසිකිලියේ දිරා ඇති අතර, අනෙක් ජල ටැංකිය සහ කැනපි 05 ඉදිරියේදී සොයා ගැනීමට කටයුතු කරමි |

### 3.6 ප්‍රසම්පාදනය

#### 3.6.1 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | කර්මාන්ත සඳහා සාධ්‍යතා වාර්තාවක් සකස් කර නොතිබුණි. | සාධ්‍යතා වාර්තා සකස් කළ යුතුවේ. | 2019 වර්ෂයේ සිට කර්මාන්ත සඳහා සාධ්‍යතා වාර්තා සකස් කරමි |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂයේ ඉටු කරන ලද හුංගම උප කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියාව සහ උහපිටගොඩ කසළ කළමනාකරණ වැඩබිමේ ගබඩාවක් ඉදි කිරීමේ කර්මාන්ත 02 කට අදාළව ඉටු නොකළ වැඩ සඳහා රු. 18,896 ක් ගෙවා තිබුණි. | ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම් නොකළ යුතුවේ. | අඩුපාඩු සකස් කරන ලෙස දන්වා ඇති අතර අඩුපාඩු නිවැරදි නොකලොත් රඳවුම් මුදලින් වැඩිපුර ගෙවූ මුදල අයකර ගැනීමට කටයුතු කරමි |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වියදම් විෂයයක අයවැයගත සීමාව ඉක්මවා රු. 5,633,190 ක් හෙවත් සියයට 61 ක වියදම් දරා තිබුණි. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | අඩුපාඩු මග හරවා ගැනීමට කටයුතු කරමි |
| (ආ) | වියදම් විෂයයක ඉතිරි වීම් රු. 619,591 ක් වූ අතර එය සියයට 49 ක් විය. | තාත්වික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | අඩුපාඩු මග හරවා ගැනීමට කටයුතු කරමි |